**පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2021**
**-----------------------------------------------**

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි අංක 5678 මූල්‍ය ගිවිසුමේ C(3) ඡේදය, II වගන්තිය, උපලේඛන 2 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**
**------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කාන්තා හා ළමා සංවර්ධන, , පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපනය, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර වැවිලි මානව සංවර්ධන භාරය හරහා ව්‍යාපෘතිය ක්‍රියාත්මකව දියත් කෙරේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. මුල් ළමාවිය සංවර්ධන සේවා සැපයීම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම යන ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කොටස් 02 ක් යටතේ ක්‍රියාවට නංවා ඇත. මූල්‍ය ගිවිසුම අනුව රු. මිලියන 7,250 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර, 2021 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**
**------**

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වය දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මාගේ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපාතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුලුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිදුවීම් සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමක් ළඟාකර ගන්නේ යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් සැලකිය යුතු විගණන නිරීක්ෂණ, අභයන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුලුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ------------------- | ------------------ | ----------------------------- | ------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | වැඩ අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට අවශ්‍ය පියවර ගත යුතු වුවද, අවස්ථා 6 කදී ගෙවා ඇති රු.115,000 මුදලක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම අත්තිකාරම් නිරවුල් කර නොමැත. | අග්‍රිම මත මූල්‍ය පාලනය ශක්තිමත් කල යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 6,000 ක ව්‍යාපෘති කාල සීමාව තුළ ගුරුවරුන්ගේ ඉගෙනීමේ අධ්‍යාපන කට්ටල සහ කියවීමේ ද්‍රව්‍ය කට්ටල ලබා දීම සඳහා රු.මිලියන 221.475 ක් වෙන් කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, මධ්‍යස්ථාන 3,386ක් සඳහා වූ උපකරණ 2021 වසර අවසන් වන විට බෙදා දී නොතිබුණි. | 2022 සැප්තැම්බර් වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. | මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් පැවැත්වීම අවශ්‍ය වේ. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | (i) කිලිනොච්චි මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු රු. මිලියන 7.76 වියදමකින් සම්පූර්ණ කිරීමට එකඟ වී තිබුණු නමුත් ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන් කර නොතිබුණි. මෙම ඉදිකිරීමේ කොන්ත්‍රාත් කාලය 2018 නොවැම්බර් 30 සිට 2019 දෙසැම්බර් 30 දක්වා අවස්ථා 3 කදී දීර්ඝ කර තිබුණු අතර, එය නියමිත ගිවිසුම් කාලයෙන් සියයට 216 ක් විය.එසේම, දීර්ඝ කිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර ඉතිරි වැඩ නිම කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු ලබා දී ඇත. | එකඟ වූ කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ. |
| | (ii) කාලය දීර්ඝ නොකිරීම හේතුවෙන් ගිවිසුම අවසන් අවසන් වීම නිසා 2019 දෙසැම්බර් 30 සිට 2021 සැප්තැම්බර් 24 දක්වා දින 632ක් සඳහා ඉහත කිලිනොච්චිය ඉදිකිරීමේ ප්‍රමාද ගාස්තුව වන රුපියල් 776,500 මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රුපියල් 388,250 වටිනා කාර්ය සාධන බැඳුම්කර අලාභය කල්පිරීමට පෙර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය සාධන බැඳුම්කරය 2020 දී කල් ඉකුත් වූ අතර කොන්ත්‍රාත්කරු බැඳුම්කරය අලුත් කර නොතිබුණි. | කාර්ය සාධන බැඳුම්කරයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2018 ජනවාරි 26 වන දින ගාල්ල කලේගාන මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2018 ජනවාරි 26 දින රු. මිලියන 6.7 ක ඇස්තමේන්තුගත අගයකට ගිවිසුමක් අත්සන් කර තිබුණි. ගිවිසුම අත්සන් කළ දින සිට දින 180කින් ව්‍යාපෘතිය අවසන් කළ යුතු වුවද, එය 2018 දෙසැම්බර් 20 දක්වා ප්‍රමාද විය. ඒ අනුව, මෙම කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස රුපියල් 674,956ක් අය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් සහ පළාත් අධීක්ෂණය ප්‍රමාණවත් නොවූ බැවින් එම කාර්යය නිම කිරීමට අමතර මාස 5ක් ගත වී ඇත. | කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අය කළ යුතුය. |